අරගලය

සූරියකන්ද භේදවාචකය



සූරියකන්ද සිසු ඝාතනය අපේ රටේ සිදුවූ අති බිහිසුණු කෲර භේදවාචකයකි. මේ එම ඝාතනය පිළිබඳ රහස් පොලිසිය කළ අපක්ෂපාතී පරීක්ෂණයේදී ඊට මුල් වූ කරුණු ඇසුරින් සකස්වූ ලිපියකි.

10 කොටස

# දත්වලින් ඇඳුම්වලින් මවුපියෝ මළ සිරුරු හඳුනා ගනිති

**සූරියකන්දෙන් මතුකරගත් සිරුරු කොටස් හා රෙදි පිළි 94.01.10 දා ඇඹිලිපිටිය අධිකරණයේ ප්‍රදර්ශනය කළ අවස්ථාවේ ඇඹිලිපිටිය ප්‍රදේශයෙන් අතුරුදන් වූ පාසල් සිසුන් 4කගේ හා තවත් අයකුගේ සිරුරු බව හඳුනා ගැනීමට ඔවුන්ගේ මවුපියෝ හා සහෝදරයෝ සමත් වූහ.**

පළමුවෙන්ම හඳුනා ගනු ලැබුවේ ඇඹිලිපිටියේ කැටගල්ආර කනිෂ්ඨ විද්‍යාලයේ ශිෂ්‍ය නායකයකු ව සිටි 17 හැවිරිදි ලලිත් උපුල් ශාන්තගේ සිරුරය. ඔහුගේ මුඛය ඇසුරින් මෙම හඳුනා ගැනීම කරනු ලැබුවේ ඇඹිලිපිටියේ හඟුරආරෙහි පදිංචි ඔහුගේ පියා වන ආර්. පියතිස්ස හා ඔහුගේ මව වන කේ.ජී. කුසුමාවතී විසින්ය.

පනාමුරේ විදුරේ පදිංචි සමරදිවාකරගේ සීතා වික්‍රමසිංහ තම මල්ලි වූ 19 හැවිරිදි අනිල් වික්‍රමසිංහගේ සිරුරු කොටස් හඳුනා ගත්තාය. ඇය සිය මල්ලිගේ සිරුරු කොටස් හඳුනාගත්තේ ඔහුගේ දත් ඇන්දට යොදා තිබූ එක් කෘත්‍රිම දතක් සහිත ඇන්දෙනි.

ඇඹිලිපිටිය වලල්ලාවිට එස්.ජී.එස්.ජී. තෝනාවතී මහත්මිය තම සැමියා වූ එච්.ජී. ප්‍රේමසිරිගේ සිරුරු කොටස් හැඳිනගත්තේ ඒ සමග වූ සරමකිනි.

මහෙස්ත්‍රාත් පී. රණසිංහ මහතා විනිශ්චයාසනයෙන් ඉවත් වූ පසුව එහි පැමිණි එල්පිටියේ ආර්ය ගුණවතී මහත්මිය සිරුරු කොටස් සමඟ තිබූ තවත් සරමකින් තම පුත් ඇඹිලිපිටියේ උඩුගම මහා විද්‍යාලයේ ශිෂ්‍ය 17 හැවිරිදි රංජිත් ජයවික්‍රමගේ බව හඳුනාගත්තාය.

එම අවස්ථාවේම තවත් පාසල් සිසුවකු වන ඇස්.පී. ගුණතිලකගේ සිරුරු කොටස් ඔහුගේ මව වන එන්. මාලහාමි මහත්මිය හඳුනාගත්තේ සිරුරු කොටස් සමග තිබූ සරමකිනි.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය ආදී සංවිධාන වෙනුවෙන් මෙදින එස්. ඒ. ප්‍රේමරත්න, පවිත්‍රා වන්නිආරච්චි, මනෝරි මුත්තෙට්ටුවේගම, ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න, ඩී.එම්. සෙනෙවිරත්න, දේශබන්දු සූරියපටබැඳිගේ නීතිවේදීහු එදින අධිකරණයේ පෙනී සිටියහ. මේ පිළිබඳව වැඩිදුරටත් දුරටත් සාක්කි විභාගය ජනවාරි 17 දාට කල් තැබිණි.

1994.01.16 (රාවය)

**ලෝකයේ ම ඇස ඇඹිලිපිටියට**

ඇඹිලිපිටියේ සූරියකන්දේ විශාල මිනී වළවල් කිහිපයක් සොයා ගැනීමේ සිද්ධිය රොයිටර්, බීබීසී ඇතුළු ප්‍රවෘත්ති සේවා මගින් ලොව පුරා ප්‍රචාරය කිරීමත් සමඟ ලොව පුරා මානව හිමිකම් සංවිධානවල ඇස ලංකාව වෙත යොමු වී ඇති අතර ලංකාවේ මානව හිමිකම් සංවිධානය මගින් කරන ලද විශේෂ ආරාධනයක් මත විදේශීය විශේෂඥ පිරිසක් සිද්ධියේ පරීක්ෂණ කටයුතු සඳහා එවීමට ද සමහර ජාත්‍යන්තර සංවිධාන දැනටමත් කැමැත්ත පළ කොට ඇත.

සූරියකන්දෙන් සොයාගත් මිනී වළවල්වල දමා ඇත්තේ තම දූ පුතුන්ගේ සිරුරු යැයි සාක්ෂි ඉදිරිපත් කිරීමට සූදානමින් සිටින ඇඹිලිපිටිය අතුරුදන් සිසුන්ගේ මවුපියන්ගේ අයිතිවාසිකම් නියෝජනය කරමින් මෙම පරීක්ෂණවලට මැදිහත්වීමට බලාපොරොත්තු වන විපක්ෂයේ නීති අංශවල හා මානව හිමිකම් සංවිධානවල ඉල්ලීම් පරිදි පළපුරුදු වෝහාරික වෛද්‍ය විශේෂඥයන් ලංකාවට එවීමට ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්, ඒෂියා වොච් වැනි ජාත්‍යන්තර සංවිධානවල සහාය ලැබෙනු ඇති බව විශ්වාස කටයුතු ආරංචි මාර්ග සඳහන් කරයි.

මීට ඉහත ඉරාකයේ හා ලතින් ඇමෙරිකාවේදී හමුවී ඇති මෙබඳුම විශාල පරිමාණයේ මිනී වළවල් සම්බන්ධයෙන් පරීක්ෂණ කොට ඒවායේ වළදමා තිබූ මිනීවලට අදාළ තොරතුරු අනාවරණය කොට ගැනීමෙන් කීර්තියට පත් ඇමෙරිකාවේ ඔක්ලොහාම විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයකු මේ සඳහා ලබාදීමට ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානයක් වන ඒෂියා වොච් සංවිධානය දැනටමත් කැමැත්ත පළ කොට තිබේ.

ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ විශේෂඥ අංශයන්ද එක්සත් ජාතීන්ගේ සංවිධානයක් ද විශේෂඥ අංශයන්ද මෙම කාරණය පිළිබඳව ඉල්ලීම් කොට තිබූ නමුත් එම සංවිධානවල පිළිතුරු දේශීය සංවිධාන වෙත ලැබී තිබුණේ නැත.

මීට අමතරව මෙම සිද්ධිය පිළිබඳව අපක්ෂපාති වාර්තා ලබා ගැනීම සඳහා තම නියෝජිත පිරිස් ලංකාවට එවීමට තවත් මානව හිමිකම් සංවිධාන ගණනක් ඉදිරිපත් වී සිටී.

මෙලෙස ජාත්‍යන්තර සංවිධාන රාශියක් ඇඹිලිපිටියේ මිනී වළවල් පිළිබඳ සිදුවීමට මැදිහත් වී ඇති බවත්, එම සිද්ධිය යටපත් කිරීමට දරන ඕනෑම උත්සාහයක් ව්‍යර්ථ කිරීමට හැකි වනු ඇති බව මානව හිමිකම් සංවිධානයක ප්‍රකාශකයෙක් පැවසීය. මෙලෙස ජාත්‍යන්තර නිරීක්ෂකයන් හා විශේෂඥයන් පැමිණීම වැළැක්වීමට රජය ඉදිරිපත් වුවහොත් මෙම ඝාතනවලට රජය වගකිවයුතු බව තහවුරු වීමට එය ම හේතුවක් විය හැකි බවද එම ප්‍රකාශකයා වැඩිදුරටත් පැවසීය.

මේ අතර මෙම මහා මිනී වළවල් පිළිබඳව පරීක්ෂණ රහස් පොලිසියට හා පොලිසියට භාර දී වැදගත් සාක්ෂි යට ගැසීමේ උත්සාහයක රජය යෙදී ඇතැයි විශ්වාස කරන විපක්ෂ කණ්ඩායම් එය වැළැක්වීමට



නීතිමය හා සංවිධානාත්මක පියවර ගැනීමට කටයුතු කරමින් සිටිති.

මේ නිසා මිනී මරුවන් කවුරුද යන්න පිළිබඳව ජනතාවට තේරුම් ගැනීමට අවස්ථාවක් ලැබී ඇතොත්, සිද්ධියේ සුල මුල හෙළිදරව් කර ගැනීම තම ප්‍රයත්නයේ අරමුණ බව විපක්ෂයේ ප්‍රකාශකයෙක් ප්‍රකාශ කළේ ය.

1994 ජනවාරි 9 :යුක්තිය පුවත්පත*

සොහොන් බිම ගැන එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් නිවේදනයක්

**(හොට් ස්ප්‍රිං නමැති එල්.ටී.ටී.ඊ. ඉංග්‍රීසි පුවත්පතේ කතු වැකියකිනි)**

රත්නපුර දිස්ත්‍රිකයේ හමුදා ආරක්ෂිත ප්‍රදේශයකින් මිනිස් ඇටසැකිලි සොයා ගැනීම මේ වන විට දකුණේ විශාල ආන්දෝලනයකට තුඩු දී තිබේ.

ශ්‍රී ලංකා හමුදාව විසින් 89 අගෝස්තු - සැප්තැම්බර් අතරතුර අත්අඩංගුවට ගනු ලැබූ ඇඹිලිපිටියේ පාසලක සිසුන් තිස් දෙදෙනකුගේ නම් මේ සිසුන්ට සිදු වූයේ කුමක් ද යන ප්‍රශ්නය නගමින් 92.5.1 දින අපි පළ කළෙමු. නැවතත් 92.1.12 දිනැති කලාපයේ තවත් සිසුන් සහ වෙනත් පුද්ගලයන් 16 දෙනකුගේ ලැයිස්තුවක් පළ කරන ලද්දේ ඔවුන් කොහේද යන සිරස්තලය යටතේයි. කිසිවෙකුත් උත්තර දුන්නේ නැත. ප්‍රශ්නයට පිළිතුරු දීමට සුවිශේෂයෙන්ම බැඳී සිටින ශ්‍රී ලංකා රජය මුනිවත රැක්කේය.

ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් - ජාත්‍යන්තර ක්ෂමා ආයතනයට හැකි වූයේ සිරිත් පරිදි කැමැත්තෙන් තොරව අතුරුදන් වූවන් ලෙස මේ නම් ලැයිස්තුගත කිරීමට පමණයි.

දැන් සිංහල ජනතාවට ඇටසැකිලි හමු වී තිබේ. එහෙත් තවමත් ශ්‍රී ලංකා ආණ්ඩුව තම සුපුරුදු ගොළු බිහිරි වත රකී.

මෙය අලුත් දෙයක්ද? සිංහලයන්ට අලුත් දෙයක් විය හැකි වුවද දෙමළ ජනතාවට ඒ අලුත් දෙයක් නොවේ.

ශ්‍රී ලංකා හමුදා කලක් මණ්ඩතිව් සියතට ගෙන සිටියේය. හමුදාව පැමිණෙන්නට පෙර ජනතාව ප්‍රදේශය අතහැර පලා ගියහ. එහෙත් කිහිප දෙනෙකුට එසේ පලා යන්නට නොහැකි විය. හමුදාව මණ්ඩතිව් හැර ගිය පසු නැවත ගමට ගිය ජනතාවට එහි ළිංවල තිබී පලායන්නන්ට නොහැකි වූවන්ගේ ඇටසැකිලි හමු විය. එය සිදු වූයේ 1990 දී ය.

ජයවර්ධන විසින් කැඳවාගෙන ආ ඉන්දියන් හමුදාව අත්පත් කර ගෙන තිබූ චාවකච්චේරි වෙළෙඳපොළ අසලින්ද වරක් ඇටසැකිලි හමු විය. එපමණක් නොවේ මඩකළපුව දිස්ත්‍රික්කයේ චාවකච්චේරිහි දී මිනිස් ඇටසැකිලි පොහොර සෑදීම සඳහා අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගත් බවද අපි වාර්තා කළෙමු. දෙමළ ඊළාම් බල ප්‍රදේශයේ හමුදා පාලනය පවත්වා ගෙන ගිය පෙදෙස්වලින් හමුදා ඉවත් කළ කල අපට නිසැකවම තවත් ඇටසැකිලි හමු වනු ඇත.

ඉතින් මේ අතුරුදන් වූවන්ගේ භීතිය පිටුපස ඇති සත්‍යය කවරෙක්ද. අද ජන ශූන්‍ය රත්නපුර වනයක සිට සිංහල ජනතාව ඉදිරියේ මේ සත්‍යය අනාවරණය වෙමින් තිබේ.

සිංහල ජනයා දැන්වත් තම නායකයන් වෙත දෙමළුන්ට එරෙහි යුද හමුදාවක් තනන්නට අවසර දීමේ අනුවණකම වටහාගෙන ඇත් ද?

ආණ්ඩුවේ ක්‍රියාත්මක නිශ්ශබ්දතාව හා කිසිවක් නොදන්නා බව හැඟවීමේ ආවරණය තුළ සිංහල තරුණයන් මරා වළදැමීමට සිංහල හමුදාවට හැකි නම් ඔවුන් දෙමළ ජනතාව වෙත කුමක් නොකරනු ඇද්ද?

දෙමළ ඊළමය මත බෝම්බ, ෂෙල් හා සියලු ආකාරයේ පාපිෂ්ට ප්‍රහාර එල්ල කරන්නවුන් තමන් ප්‍රශ්න කෙරෙන කල ඇඟ බේරාගැනීම සඳහා අශෝභන හා නිර්ලජ්ජී ලෙස සියලු චෝදනා ප්‍රතික්ෂේප කරමින් තමන් පහර දෙන්නේ කොටි ඉලක්කවලට බව කියනු ලබන බව ඔබ දන්නේද? ඒ ප්‍රහාරවලට ඇස් පනාපිටම ගොදුරුවන ළදරුවන් ගැහැනුන් හා මහල්ලන් අතර එකම කොටියකු හෝ නොමැති බව ඔබ දන්නවාද?

සිංහල නායකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයේ ගොදුරු බවට පත්ව සිටින සිංහල ජනතාව ගැන අපි කනගාටු වෙමු. එහෙත් ආචාරශීලීත්වය ඇරඹෙන්නේ ගෙදරිනි. එහෙයින් සිංහල පාලකයන්ගෙන් සහ ඔවුන්ගේ හමුදාවෙන් විමුක්තිය ලැබීම පිණිස අපි සටන් වදිමු.

**පරීක්ෂණය කල් දාන්න රහස් පොලිසිය උත්සාහ කරයි**

සූරියකන්දෙන් හමුවූ මිනී ඇටකටු පිළිබඳව අධිකරණ වෛද්‍ය වාර්තා ලබා ගැනීමට වසරක පමණ කාලයක් ගතවන බැවින් ඒ වන තෙක් නිගමනයකට හෝ වැඩිදුර ක්‍රියාමාර්ගයකට හෝ නොයා යුතුය යන තර්කයක් මතු කිරීමට සූරියකන්ද මිනී ඇටකටු සම්බන්ධ මහෙස්ත්‍රාත් පරීක්ෂණයේදී රහස් පොලිසිය උත්සාහ දැරීය.

තම පරීක්ෂණය සිදුකෙරුණු මෙම ඇටකටු ඇඹිලිපිටියේ අතුරුදන් ශිෂ්‍යයන් ද පිළිබඳව බවත් ඇටකටු ඔවුන්ගේ බවට හඳුනාගැනීමත් සිදුවී නැති බැවින් තමන්ගේ පරීක්ෂණ කටයුතු අවසන් බවත් මෙම පරීක්ෂණ භාරව කටයුතු කරන රහස් පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් යුක්තියට ප්‍රකාශ කළේ ය.

මෙලෙස මෙම පරීක්ෂණය යටගැසීමේ හෝ කල් දමා ගැනීමේ හෝ උත්සාහයක රජයේ යෙදී සිටින නමුත් විපක්ෂය හා මානව හිමිකම් සංවිධානය එය කෙසේ හෝ මතුකර ගැනීමේ උත්සාහයක යෙදී සිටී.

තවත් ගොඩ ගැනීමට මිනී ඇටකටු විශාල ප්‍රමාණයක් සූරියකන්දේ ඇති බවත්, සැක කටයුතු ස්ථාන රාශියක් පරීක්ෂාවට ලක් කිරීමට තිබෙන බවත් අප තතු දත් ආරංචි මාර්ග සඳහන් කරයි.

**(භීෂණ සමයේ ශ්‍රී ලංකාවේ සිටි ඇමෙරිකන් පුවත්පත් කලාවේදියකු වන ස්ටීවන් කෝල්ගේ සටහනකින් උපුටා ගන්නා ලදී)**

**ලබන සතියට**

raviprasadherat@gmail.com

**සැකසුම:රවිප්‍රසාද් හේරත්**